ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත

LP - QD / 118/ News/ 2011

ක්‍රි. ව. 2011 ඔක්තෝබර් 31 සඳුදා
04 වෙළුම - 02 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00



# ළමා ප්‍රදීපය



## 'හැලොවීන් දිනය' ගැන දැනුවත් වෙමු...!

ලමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - **2695984 / 4899611**
ෆැක්ස් : 2692586 - ඊ-මේල් **pradeepaya@yahoo.com**
වෙබ් අඩවිය - **www.colombocatholicpress.lk**

# හැලොවීන් දිනය දැන ගනිමු

## ආදරණීය දුවේ පුතේ...

අද අපි කථා කරන්න යන්නෙ ඔක්තෝබර් 31 වනදාට සාමාන්‍යයෙන් සැමරෙන දිනයක් පිළිබඳවයි. මේ දිනය සම්බන්ධයෙන් පෙරදිග රටවල එතරම් තේරුම් ගැනීමක් නොතිබුණත් බටහිර රටවල නම් මෙම දිනය ප්‍රසිද්ධ දිනයක්. විශේෂයෙන්ම කුඩා ළමුන් අතර ඉතාම ජනප්‍රිය දිනයක්. මේ දිනය හැලොවීන් දිනය (Halloween) නමින් නම් කිරීමට හේතු කිහිපයක්ම බලපා තිබෙනවා.

පෙර රෝම අධිරාජ්‍ය සමයේ මුලින්ම මෙය මංගල්‍යයක් සේ සැමරුවා. අස්වැන්නට හා ධාන්‍යයට අධිපති දෙවඟනක් වන පොමෝනා ( Pomona ) දෙවඟන සමරන්නට මෙම දිනය යොදා ගත් බව ඒ අතීත කථා සිහිපත් කරනවා. ඒ වගේම මළවුන්ගේ මංගල්‍යය සමරන්නට නැතිනම් "පේරන්තාලියා" (Parentalia) නමින් නම් කෙරුනු මේ මළවුන් සම්බන්ධ මංගල්‍යය සමරන්නට මෙය මුල් වී තිබෙනවා. බ්‍රිතාන්‍ය හා අයර්ලන්ත රාජ්‍යයන්ට අයත් දූපත් වැසියන් මූලික කොට මෙම මංගල්‍යය සමරන්නට මුල්වී තිබෙන්නේ ගිම්හාන සමය අවසන් වූ බව හඟවන්නට ගත් උත්සාහයක් හැටියටයි.

ආදර දුවේ පුතේ, මේ හැලොවීන් කියන නමේ ආරම්භ ය ගැන කල්පනා කර බලන විට ස්කොට්ලන්ත ආභාෂයක් ඇතිව 16 වන ශත වර්ෂයේ උපත ලත් වචනයක් හැටියට කල්පනා කර බලන්න පුළුවන්. ( All-Hallows - Even ) සියළු සාන්තුවරයන්ගේ මංගල්‍යයට පෙර සැන්දෑව කියන තේරුම අනුව තමයි ස්කොට්ලන්ත ආභාෂය ඇතිව මෙය එක් අතකින් උපත ලබා ඇත්තේ.

දැන් අපි බලමු මේ දවසේදී කුඩා දරුවන් මොනවාද කරන්නේ කියලා. පෙර කල පටන් වර්ධනය වෙමින් පැවති මේ මංගල්‍යය පිළිබඳ අදහස හා සැමරීම අද වන විට සම්පූර්ණයෙන්ම කුඩා දරුවන් අත්දකින සැමරීමක් බවට පත්වී තිබෙන බව අවට ලෝකය දිහා බලන විට පැහැදිලියි. විශාල පළතුරු හෝ එළවළු ගෙඩි වලින් ලන්තෑරුම් නැතිනම් බකට් සාදාගෙන මේ හැලොවින් රාත්‍රියේ වීදී සංචාරය කරමින් ගෙයින් ගෙට යන්නට කුඩා ළමුන් පුරුදු වී තිබෙනවා. වර්ණවත් කල මුහුණු වලින් සහ විවිධ ඇඳුම් මෝස්තර ප්‍රදර්ශනය කරමින් මේ දවසේදී කුඩා ළමුන් සැරසෙනවා. වට්ටක්කා ගෙඩි වලින් සමහර විට නිවෙස් පවා සරසන්නට මේ දවසේදී කුඩා ළමුන් පෙළඹෙනවා. මළවුන්ගේ හා සියළු සාන්තුවරයන්ගේ දිනයන් සැමරීමට පෙර දිනයක් වූ ඔක්තෝබර් 31 වන දා මෙම දිනය සැමරීම තුළින් ක්‍රිස්තියානි මංගල්‍යයක ලක්ෂණ මේ වෙනකොට මේ දිනය මුල් කොට ඉස්මතු වී තිබෙනවා. මෙය මංගල්‍යයක් සේ සමරනු නොලැබුවත් සිහිපත් කිරීමේ දිනයක් සේ යොදා ගෙන තිබෙනවා. ඒ අනුව විවිධ ඇඳුම් ආයිත්තම් වලින් සැරසෙන විට ඇටසැකිළි හා අවතාර නිරූපනය කරන ඇඳුම් පැළඳුම්ද දැකිය හැකියි. හරියට ඩ්‍රැකියුලා හෝ මමී ( Dracula or mummy ) යන චරිත පෙන්නුම් කරන ආකාරයේ ඇඳුම් පැළඳ ගැනීමට මේ දිනය සැමරීමේදී කුඩා දරුවන් ප්‍රිය කරනවා.

ආදර දුවේ පුතේ,

එයටත් හේතුවක් තියෙනවා. දැන් මේ කුඩා දරුවන් මෙහෙම විවිධ චරිත සේ හැඳ පැළඳගෙන ගෙයින් ගෙට යනවා. එසේ ගොස් ඔවුන් අසන ප්‍රශ්නයක් තිබෙනවා. විජ්ජාවක්ද ? සංග්‍රහයක්ද ? ( Trick or Treat ?) මෙහිදී යම් විජ්ජාවක් වැනි බිය ගැන්වීමක් මෙයින් හැඟෙනවා නේද ? ඉතින් වැඩිහිටියෝ පැණි රස කෑම තියාගෙන ඉන්නවා මේ දරුවන් ගෙවල් වලට ආපු විගසම ලබා දෙන්න. සමහර අය මුදල් පවා දෙනවා. හරියට නත්තල් කාලෙ කුඩා ළමයින් කැරොල් ගායනය යනවා වගේ. මෙය දැන් ක්‍රීඩාවක් වුනාට මෙයින් ක්‍රිස්තියානි හැඟීමක් ප්‍රබලව ඉස්මතු වෙනවා. කතෝලික හැඟිමක් තිබෙනවා මරණින් පසු ආත්මයන් සැරිසරනවා කියලා. විශේෂයෙන්ම මළවුන්ගේ දිනය සැමරීමට පෙර මේ ආත්මයන් පිළිබඳව ජනතාව වැඩිපුර කල්පනා කරනවා. එදා දුප්පත් ජනතාව ගෙයින් ගෙට ගියේ මේ මළවුන් වෙනුවෙන් යාච්ඤා කරන බවට පොරොන්දු වෙමින් ආහාර ඉල්ලා ගෙනයි. එයත් මෙයට යම් සම්බන්ධයක් තිබෙනවා.

ආදර දුවේ පුතේ, අපි උත්සවයක් වෙනුවෙන් ගෙවල් සරසනවා නේද ? දැන් මේ හැලොවීන් දිනය දවසේදීත් ගෙවල් සරසන්නට ළමුන් පෙළඹෙනවා. හැබැයි විශේෂයක් තිබෙනවා. ඒ තමයි වට්ටක්කා ගෙඩි වලින් විවිධ රූප නිර්මාණය කරලා ඇටසැකිලි, අවතාර වගේ රූපවලින් තමයි මෙදින ගෙවල් සරසන්නෙ. මෙහි කිසිම අද්භූත බියකරු බවක් නැහැ. තිබෙන්නේ අර මළවුන් සැමරීම සංකේතවත් කිරීම පමණයි.

ඒ වගේම හැලොවීන් සාද පවා පැවැත්වෙනවා. හැබැයි මෙහිදී විශේෂයෙන්ම කථා කරන්නේ හොල්මන් කථා පිළිබඳවයි. බිය උපදවන චිත්‍රපට කථා, හොල්මන් කථා මේ සාද වලදී කථාවට ලක් වෙනවා. කතෝලික සභාව අදටත් විශේෂයෙන් බටහිර රටවල කුඩා ළමුන් මේ කරන සැමරුම පිළිබඳව යම් අවධානයක් යොමු කරලා තියෙනවා. හානියක් නොවන ආකාරයෙන් මෙම සැමරීම කරන්නට වැඩිහිටියන් පවා දරුවන්ට උදව් වෙනවා.

අතීත සිදුවීම අනුව මේ හැලොවීන් දිනය ආරම්භ වී තිබුණත් අද වනවිට සියලු සාන්තුවරයන්ගේ හා මළවුන්ගේ දිනයට සම්බන්ධව හැලොවීන් සැමරීම කරනු ලබනවා. මිථ්‍යාදෘෂ්ටික ආකල්පයක් මෙහි තිබෙන බව සමහර විචාරකයින් පැවසුවත් අද වනවිට ළමුන් සතුටට පත් වන සැමරීමක් නිසා කතෝලිකයන් බොහෝ විට මළවුන් සැමරීමට හා සියලු සාන්තුවරයන් පිළිබඳව ළමුන් වඩාත් දැනුවත් කරන්නට මේ සැමරීම හේතුවක් කරගෙන තිබෙනවා.

ඉතින් පුංචි ඔබටත් පුළුවන් මේ පිළිබඳව අපේ කතෝලික විශ්වාසයේ ඇසින් බලා තවත් ඉගෙන ගන්නට. ඒ සඳහා කරුණු සොයාගෙන කියවන්නට පුංචි ඔබත් උත්සහයක් දරන්න.

ඔබ සැමට ජේසු පිහිටයි !
සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# වෙන්නප්පුව මීසමේ දහම් ළමුන්ගේ තරගාවලියේ පළමු ස්ථාන ලැබූ ජයග්‍රාහකයෝ !

**(කුමර නයනජිත් විසිනි)**

වෙන්නප්පුව දහම් දූ පුතුන්ගේ කලා කුසලතාවයන් ඔප් නැංවීමේ අරමුණින් යුතුව පැවැත්වූ "තලෙන්තු" ප්‍රසංගය ඔක්තෝබර් 29 දින පස්වරුවේ අභිනවයෙන් ඉදිකල වෙන්නප්පුව මීසම් ශාලා ගොඩනැගිල්ලේ රංග පියයේදී පැවැත්වුණි. මීට සමගාමීව වෙන්නප්පුව මීසමේ වෙන්නප්පුව සා. ජෝශප්, ගංගොඩ සා. මාටින්ද පෝරස්, නුගගහමුල්ල ජේසු බිළිඳු හා කොලින්ජාඩිය ලූර්දු මාතා යන දහම් පාසල් හි ළමුන් සඳහා පැවති කථික, ගායනා, චිත්‍ර, රචනා හා බයිබල් දැනුම් මිනුම තරග වල ජයග්‍රාහිකාවන්ට තිළිණ හා සම්මාන ප්‍රධානයද මෙදිනම සිදු කෙරෙනි. මෙහිදී මෙම තරග අංශයන්හි පළමු ස්ථානයන් දිනූ අයගේ නම් මෙහි වෙති.

## කථික

**1 ශ්‍රේණිය -**
මිලිති කවිෂා - සා. ජෝසප් දහම් පාසල - වෙන්නප්පුව

**2 ශ්‍රේණිය -**
සචින්දි ආකාෂා - සා. ජෝසප් දහම් පාසල- වෙන්නප්පුව

**3 ශ්‍රේණිය -**
සමෝෂි මසාරා - සා. ජෝසප් දහම් පාසල - වෙන්නප්පුව

**4 ශ්‍රේණිය**
ශකිලා ආංජලි - සා. ජෝසප් දහම් පාසල - වෙන්නප්පුව

**5 ශ්‍රේණිය -**
ඇන් ෂෙනාලි - සා. ජෝසප් දහම් පාසල - වෙන්නප්පුව

**6 ශ්‍රේණිය -**
ඇන් ලක්නි - සා. ජෝසප් දහම් පාසල - වෙන්නප්පුව

**7 ශ්‍රේණිය -**
සචිනි අමන්දා - සා. ජෝසප් දහම් පාසල - වෙන්නප්පුව

**9 ශ්‍රේණිය -**
ක්‍රිෂාන් නිමේන්ද්‍ර - සා. ජෝසප් දහම් පාසල - වෙන්නප්පුව

**10 ශ්‍රේණිය -**
ඇන්ටන් කවිදු - සා. ජෝසප් දහම් පාසල - වෙන්නප්පුව

## ගායනා

**1 ශ්‍රේණිය -**
කවිදු නදිෂා - සා. ජෝසප් දහම් පාසල - වෙන්නප්පුව

**2 ශ්‍රේණිය -**
සචින්දි ආකාෂා - සා. ජෝසප් දහම් පාසල - වෙන්නප්පුව

**3 ශ්‍රේණිය -**
සමෝෂි තෂාරා - සා. ජෝසප් දහම් පාසල - වෙන්නප්පුව

**4 ශ්‍රේණිය -**
නතාෂා ග්‍රාසියෙල්ලා - සා. ජෝසප් දහම් පාසල - වෙන්නප්පුව

**5 ශ්‍රේණිය -**
රවිෂ්ක ෂෙමිරාන් - සා. මාටින්ද පෝරස් දහම් පාසල - ගංගොඩ

**6 ශ්‍රේණිය -**
ශල්කි ඇන් මධුෂිකා - සා. මාටින්ද පෝරස් දහම් පාසල - වෙන්නප්පුව

**7 ශ්‍රේණිය -**
අංජලිකා රුවන්මලි - සා. මාටින්ද පෝරස් දහම් පාසල - ගංගොඩ

**8 ශ්‍රේණිය -**
ලහිරු ලක්ෂාන් - ලූර්දු දේව මාතාදහම් පාසල - කොලින්ජාඩිය

**9 ශ්‍රේණිය -**
ඩිලානි නිපුණිකා - සා. ජෝසප් දහම් පාසල - වෙන්නප්පුව

**10 ශ්‍රේණිය -**
ජයනි චේතනා - ලූර්දු දේව මාතා දහම් පාසල - කොලින්ජාඩිය

**11 ශ්‍රේණිය -**
සාසිත ඩිල්ෂාන් - සා. ජෝශප් දහම් පාසල - වෙන්නප්පුව

## චිත්‍ර

**1 ශ්‍රේණිය -**
නිපුනි සාරා ප්‍රනාන්දු - සා. ජෝශප් දහම් පාසල - වෙන්නප්පුව

**2 ශ්‍රේණිය -**
ඩියොන් අනීෂ - සා. ජෝසප් දහම් පාසල - කොලින්ජාඩිය

**3 ශ්‍රේණිය -**
නෙත්මිනි දිල්රුක්ෂිකා - ලූර්දු දේව මාතා දහම් පාසල - කොලින්ජාඩිය

**4 ශ්‍රේණිය -**
අශාන් තරිඳු - ශා. මාටින්ද පෝරස් දහම් පාසල - ගංගොඩ

**5 ශ්‍රේණිය -**
අනිශ්ක ප්‍රවින් දිල්ෂාන් - සා. මාටින් ද පෝරස් දහම් පාසල - ගංගොඩ

**6 ශ්‍රේණිය -**
ලූෂානි මීරියම් ප්‍රනාන්දු - සා. ජෝසප් දහම් පාසල - - කොලින්ජාඩිය

**7 ශ්‍රේණිය -**
ඒ.රුචිනි ඇන්ජලා ප්‍රනාන්දු - සා. ජෝසප් දහම් පාසල - කොලින්ජාඩිය

**8 ශ්‍රේණිය -**
රොමේනි තැරල් අමරසිංහ - සා. ජෝසප් දහම් පාසල - වෙන්නප්පුව

**ඉතිරිය 07 පිටුවේ**

# 2011 ජාතික ළමා නාට්‍ය උලෙළේදී වැල්ලවත්ත සා. ලෝරන්ස් කන්‍යාරාමයෙන් කැපී පෙනෙන දස්කම්...

## වසරේ හොඳම ළමා නිළිය සම්මානය සමගින් කුසලතා සම්මාන දෙකක් දිනයි.





2011 ජාතික ළමා නාට්‍ය උළෙලේදී වැල්ලවත්ත සා. ලෝරන්ස් කන්‍යාරාමය ඉදිරිපත් කළ "අංකලුත් අපේ සීයා වගේමයි" ළමා නාට්‍ය අවසාන වටය නියෝජනය කරමින් මෙවරද සම්මානයට පාත්‍ර විය. සම්මාන ප්‍රධානය පසුගිය දා ජෝන් ද සිල්වා සමරු රඟහලේදී පැවැත්වුණි.

මෙහිදී 2011 වසරේ හොඳම ළමා නිළිය සම්මානය අවිෂ්කා ජයසිංහ ශිෂ්‍යාව විසින් හිමි කරගත් අතර 2011 වසරේ හොඳම සහය නළුවා සම්මානය සඳහා කුසලතා සහතිකය ෆිඩේලියා ප්‍රානාන්දු ශිෂ්‍යාව විසින් දිනාගනු ලැබීය. අවිෂ්කා සහ ෆිඩේලියා සිසුවියන් 12 ශ්‍රේණිය (වාණිජ අංශය) සහ 3 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන්නීය.

හොඳම නාට්‍ය පිටපත් රචනය සඳහා කුසලතා සහතිකයක් "අංකලුත් අපේ සීයා වගේමයි" ළමා නාට්‍යයට හිමි විය. මෙම නාට්‍යය අධ්‍යක්ෂණය කරමින් නිෂ්පාදනය කරනු ලැබුවේ විදුහල්පතිනි ගරු මේරි චන්ද්‍රිකා ප්‍රනාන්දු පැවිදි සොයුරිය විසිනි.

ප්‍රවීන රංගන ශිල්පීන් වන අයිරාංගනී සේරසිංහ හා විජේරත්න වරකාගොඩගේ අතින් හොඳම ළමා නිළිය හා කුසලතා සම්මාන ලැබූ දියණියෝ සේයාරුවෙහි වෙති.

**ශ්‍යාමලි ප්‍රියන්ගිකා**

# ගම්පහ සිරිකුරුස බැඩ්මින්ටන් ක්‍රීඩිකාවන්ට තවත් ජයක් !




ශ්‍රී ලංකා පාසල් බැඩ්මින්ටන් සංගමය විසින් සංවිධානය කරන ලද 2011 වසරේ වයස අවුරුදු 18 න් පහළ සමස්ත ලංකා යුගල බැඩ්මින්ටන් කණ්ඩායම් තරගාවලිය පසුගියදා නුවරඑළිය ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී නිමාවට පත්විය. එහිදී බාලිකා කොටසේ " D " ශූරතාවය දිනා ගැනීමට ගම්පහ සිරිකුරුස විද්‍යාලීය බැඩ්මින්ටන් කණ්ඩායම සමත් විය. සිරිකුරුස ක්‍රීඩිකාවෝ පුහුණුකරු මහේෂ් ඒකනායක මහතාගේ මග පෙන්වීම යටතේ මෙම වසරේ තරගාවලි කිහිපයකදී ශූරතාවයන් දිනා ගනිමින් විශිෂ්ට දස්කම් පෑමට සමත් වූහ.

ශූරතාවය දිනාගත් කණ්ඩායම ගරු මේරි දීපානි පැවිදි සොහොයුරිය (විදුහල්පතිනි) හා මහේෂ් ඒකනායක (පුහුණුකරු) මහතා සමඟ සමූහ ඡායාරූපයකට මුහුණ දුන් අයුරු **(කුමර)**

**මාසික සිතිවිල්ල**

මෙහි පළ වන සේයාරුවට ගැලපෙන පරිදි ඔබගේ අලංකාර ගද්‍ය හා පද්‍ය නිර්මාණය අප වෙත යොමු කරන්න. ඔබ එවන නිර්මාණය සමඟ ඔබේ නම, ලිපිනය, ශ්‍රේණිය, පාසල, දහම් පාසල හා දුරකථන අංකය ද පැහැදිලිව ලියා පහත ලිපිනයට යොමු කරන්න.



මාසික සිතිවිල්ල, "ඔක්තෝබර් මාසය" ළමා ප්‍රදීපය,
අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

**ජයග්‍රාහී නිර්මාණය ලබන සතියේ පළ කෙරේ**

# නොවැම්බර් හෙවත් ඉල්

ශීත ඍතුව ආරම්භයේදීම මස් සුරක්ෂිත කර තබනු ලබන මාසය අරුත් ගන්වමින් මෙම මාසයට හීල් හෙවත් ඊල් යන නම ලැබී තිබේ. අධික සීතල සහ අධික වර්ෂාව ගෙන දෙන්නාවූ යන අරුත, හීල් හෙවත් ඉල් හි ගැබ් වේ.

කතෝලික සභා මාතාව නොවැම්බර් මාසයට මළවුන්ගේ මාසය යැයි නම් කරන්නීය. මෙම මාසය තුළදී කතෝලිකයෝ විශේෂාකාරයෙන් මළවුන් වෙනුවෙන් යාච්ඤා කරමින් ඒ හා සම්බන්ධ විවිධාකාර දේව මෙහෙයන් හා වෙනත් භක්ති අභ්‍යාසයන් හි යෙදෙති.

## නොවැම්බර් 05 - යුද්ධය සහ අවි අරගලයෙන් පරිසරය විනාශය වැලැක්වීමේ ජාත්‍යන්තර දිනය

2011 නොවැම්බර් 05 වන දින එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩලය විසින් සෑම වසරකම නොවැම්බර් මස 06 වන දින යුද්ධය සහ අවි අරගලයෙන් පරිසරය විනාශය වැලැක්වීමේ ජාත්‍යන්තර දිනය ලෙස නම් කරන ලදී.

ඕනෑම යුද්ධයකින් සෙබළුන් මෙන්ම සාමාන්‍ය ජනතාව මරණයට පත් වෙයි. එම මරණයෙන් එම ජීවිතය විනාශ වී යයි. යුද්ධයෙන් සිදුවන සෑම මරණයකින්ම අසරණත්වයට පත්වන දෙමව්පියෝ බිරින්දෑවරු දූදරුවෝ කාලයක් සමග සහනාධාරයක් ලබා ගෙන ජීවිතයට නැවත මුහුණ දෙති. මෙ පරම්පරාව මිය ගිය පසු යුද්ධයෙන් එම පවුලේ මිය ගිය අය ගැන දුක්වන්නට කිසිවකු ඉතිරි නොවේ.

යුද්ධයෙන් පරිසරය ද මිය යයි. පරිසරයේ සුන්දරත්වය විනාශ වී යයි. මිය යන පරිසරයට සහ මිය යන පරිසරයේ සුන්දරත්වයට සහනාධාර නොලැබේ. ලැබුණත් එයින් කිසි ඵලක් නැත. පරිසරයේ විනාශ වෙනුවෙන් සහනාධාර ලැබුණත්, ඒ විනාශය වෙනුවෙන් කළහැකි කිසිවක් නැත. එබැවින්, යුද්ධය කුමන සිද්ධාන්තයක පිහිටා සාධාරණ වුවද, එයින් පරිසරයට සිදුවන විනාශ අසාධාරණය එබැවින් යුද්ධය සහ අවි අරගලයෙන් පරිසරය විනාශය වැලැක්වීමට අපි උත්සාහ ගනිමු.

## නොවැම්බර් 17 අන්තර් ජාතික ශිෂ්‍ය දිනය

පාසල් අධ්‍යාපනයේ යෙදෙන පිරිස පමණක් නොව උසස් අධ්‍යාපන ආයතනවලට විශේෂයෙන් විශ්ව විද්‍යාලවල ඉගෙනීම ලබන පිරිස ද ශිෂ්‍යයන් ලෙස සැලකේ, එසේ වුවද, සෑම වසරක ම නොවැම්බර් 17 වන දිනට යෙදෙන අන්තර් ජාතික ශිෂ්‍ය දිනයේ දී විශේෂයෙන් සාකච්ඡාවට බඳුන්වන්නේ, පාසල් අධ්‍යාපනයේ නියැලෙන ශිෂ්‍ය ප්‍රජාවයි.

සෑම දරුවකුගේම හෙට දිනයේ අයිතිය එම දරුවාට උරුමවන්නේ, ඔහු හෝ ඇය ශිෂ්‍යයකු හෝ ශිෂ්‍යාවක වුවහොත් පමණි. අධ්‍යාපනය සෑම පුද්ගලයකුම ලැබිය යුත්තක් නිසාම, අන්තර් ජාතික ශිෂ්‍ය දිනයේදී අධ්‍යාපනය ලැබීමේ අයිතිවාසිකමට යටත් වන සියල්ලන් ගැන කතා බහ කෙරෙති.

ශිෂ්‍යයෝ යනු ගුරුවරු නොවෙති. ශිෂ්‍යයෝ ඉගෙනීමේ කාර්යයට යටත් වෙයි. එසේ නොමැතිව ඉගෙනීමේ කාර්යය ශිෂ්‍යයාට යටත් නොවේ. ශිෂ්‍යයා ඉගෙනීමේ කාර්යයට යටත් විය යුත්තේ, ගුරුවරයාට යටත් වීම තුළ ය. ගුරුවරයාට යටත්වීම තුළ ගුරුවරයාගේ ඔවදන් තුළ මනා හික්මීමකින් කටයුතු කිරීම ශිෂ්‍යයාගේ යුතුකමකි.

අන්තර් ජාතික හිෂය දිනයේ දී ශිෂ්‍ය ප්‍රජාව තමන්ට ලැබිය යුතු අයිතිවාසිකම් හෝ වෙනත් ලැබීම් ගැන අවධානය යොමු කරනවාට වඩා හික්මීම තුළ ගුරුවරයාගෙන් අධ්‍යාපනය ලැබීමට අධිෂ්ඨාන කර ගැනීම යහපත්ය.




**විශ්ව දින පොත**

## නොවැම්බර් 19 - ළමා අපචාර වැළැක්වීමේ ලෝක දිනය

ළමා අපචාර සඳහා වැඩි වශයෙන් ගොදුරු වන්නෝ වයස අවුරුදු 8-14 අතර ළමුන්ය. බටහිර රටවල මිනිසුන් කළු මිනිසුන්ට ඇති ඇල්ම හේතුවෙන් මෙම ප්‍රවණතාවය වර්ධනය වී ඇතැයි සමීක්ෂණවලින් පැහැදිලි වේ. සංඛ්‍යා ලේඛනවලට අනුව, තායිලන්තය. පිලිපීනය, ශ්‍රී ලංකාව යන රටවල් තුනේ වයස අවුරුදු 16 ට අඩු ළමා ගණිකාවෝ 500,000 ක් පමණ සිටිති. එයින් 50,000 කට ආසන්න පිරිසක් වයස අවුරුදු 13 ට අඩු අය වෙති. (සංඛ්‍යා ලේඛන : 1998)

ළමා ගණිකාවන්ගේ ලිංගිකාස්වාදය පතමින් බ්‍රිතාන්‍යය ඇමෙරිකා එක්සත් ජනපදය, ජර්මනිය වැනි රටවල සංචාරකයෝ තුන්වන ලෝකයට ඇදී එති. දරුවන් මෙසේ ළමා අපචාර වල යොමු වෙද්දී සමහර දෙමාපියෝ අන්ධව කටයුතු කිරීම ශෝචනීය ය. මොකද මගේ කොල්ලට දරුවෝ හම්බ වෙනවද ? වැල්ලේ හිටියට බඩට දරුවෝ එනවද ?" වැනි පටු ආකල්පවලින් කටයුතු කරමින්. ළමා අපචාරවලට තම දරුවන් යොමුවීමේ කිසිදු දෝෂයක් නැතැයි සිතන වැඩිහිටියෝ ද සමාජයේ සිටිති.

කවුරුන් කුමක් කරනවාදැයි තර්ක විතර්ක මැද කටයුතු කරනු වෙනුවට, කුමක් හරිදැයි සිත යොමු කරමින් ළමා අපචාර වැළැක්වීමට කටයුතු කර, සදාචාර සම්පන්න ලෝකයක් බිහි කිරීමට අපි ආයක වෙමු.

අලගොල්ලෑව සා. අන්තෝනි මහ විද්‍යාලයේ ගුරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.

# 2011 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරික්ෂණ පාඩම් මාලාව

අලගොල්ලෑව සා. අන්තෝනි මහ විද්‍යාලයේ
ගුරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.

**පසුගිය සතියේ පළවූ කෙටි ප්‍රශ්න සඳහා පිළිතුරු**

1. සියල්ල පොදු තබා ගැනීම.
2. දිවැසිවර - දහම් පාසල්වල ඉගැන්වීම
   භාවනා මෙහෙයවීම
   බයිබල් පාඨමාලා පැවැත්වීම

   පූජක - පූජා උදව් සේවය
   යාම යැඳුම කියවීම
   කියවීම සඳහා දායකවීම
   හදිසි අවස්ථාවලදී ප්‍රසාද ස්නානය ප්‍රදානය කිරීම

   එඬේරික - පදවිය තුළ ගිහි නායකත්වය
   සභාවේ දියුණුව සඳහා යෝජනා ඉදිරිපත් වීම
3. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ
4. ආශීර්වාදකාර බන්ධනය, පූජකවරය
5. ගීතාවලිය
6. දිව්‍ය පූජාවට සහභාගීවීම, දහම් පාසල් යාම
7. සාගතය, නියඟය, මන්දපෝෂණය, ගංවතුර
8. ඔරතෝරියානු නිකාය
9. අවංකව වැඩ කිරීමෙන්, මිලයට ගැනීමෙන්, හුවමාරුවෙන්, තෑගි වශයෙන්, උරුම වශයෙන්
10. ප්‍රේමය සත්‍යය සාධාරණත්වය .
11. ඒසව් සහ ජාකෝබ්
12. මරියාණන්ගේ උදාන ගීය, සෙකරියස්ගේ ප්‍රශංසා ගීතය.
13. ප්‍රැන්සිස්කාන් පැවිදි නිකාය
14. .පාපෝච්චාරණය හෙවත් සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය, රෝගීන්ගේ ආලේපය
15. ජුදාස් වෙනුවට මතියස් තෝරා ගැනිමෙන්
16. කීකරුකම, ව්‍රත ශුද්ධිය, දිළිඳුකම
17. ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා
18. හෙබ්‍රෙව්වරුන් (ඊශ්‍රායෙල්වරු)
19. පොහොසත් තරුණයා
20. අසීසියේ ප්‍රැන්සිස් මුනිතුමා
21. මතෙව් - කන්ද උඩ දේශනය
    ලූක් - තැනිතලාවේ දේශනය
22. පාපය, ධර්මිෂ්ඨකම, විනිශ්චිය
23. පළමු මැවීමේ කථාව - පූජක සම්ප්‍රදාය
    දෙවන මැවීමේ කථාව - යාවිස්ත සම්ප්‍රදාය
24. පව්වලට සැබෑ මනස්ථාපනය විම, පාපෝච්චාරණය කිරිම, තෘප්තිමත්වීම
25. ජාකොබ්ගේ හසුන
26. පූජා උදව් සේවය, යාම යැඳුම කියවීම, කියවිම සඳහා දායකවීම
27. වැන්දඹුව සහ විනිශ්චයකාරයා පිළිබඳ උපමාව
    පරිසිවරයා සහ අයකැමියා පිළිබඳ උපමාව .
28. තුන්කාලේ ආරාධනාව
29. ධනපතියා සහ ලාසරස්
30. විශ්වාසය, සදාචාරය
31. ආධ්‍යාත්මික ශරීරය
32. ශුද්ධවු ඉග්නේෂියස් ලොයෙලා මුනිතුමා
33. ප්‍රසාද ස්නාපනය, දිව්‍ය සත්ප්‍රසාදය, අභිවෘද්ධි ආලේපය.
34. දිව්‍ය සත්ප්‍රසාදය
35. මහා තුති පූජාව හෙවත් දිව්‍ය පූජා යාගය,
    ප්‍රසාද නිධාන,
    සභාවේ පොදු යාච්ඤාව හෙවත් යාම යැදුම
36. බෞතීස්ම ස්නාපනය ලබන සංඝය
37. ද්වීතිය නීති සංග්‍රහය
38. “ශුද්ධවු ජෝන් ක්‍රිසොස්තම් තුමා
39. පරිසිවරයා සහ අයකැමියා පිළිබඳව උපමාව
40. වැන්දඹුව සහ විනිශ්චයකාරයා පිළිබඳ උපමාව
    මහ රෑ පූප ඉල්ලූ මිත්‍රයා පිළිබඳ උපමාව
41. පළමු කොරින්ති ලිපිය
42. ජාකොබ්
43. වතුර ලේ වීම, කුළුඳුන් මැරීම
44. ජලය වත් කිරීම සහ ශුද්ධවු ත්‍රිත්වයේ නාමයෙන් බෞතීස්ම ස්නාපනය කිරීම
45. ප්‍රසාද ස්නාපනය, අභිවෘද්ධි ආලේපය, පූජාත්වරය
46. පූප කැඩීම
47. මරියා ගොරොට්ටි මුනිවරිය
48. ආත්මික පුන්‍ය ක්‍රියා, ශාරීරික පුන්‍ය ක්‍රියා
49. වාචික භාවනා ධ්‍යානයට සම වැදීම
50. මෝසෙස්ගේ යාච්ඤාව
51. ලව්රා
52. අගුස්තීනු මුනිතුමා

53. බුද්ධිය, හෘදය සාක්ෂිය, ස්මරණ, නිදහස
54. ප්‍රඥාව හා තේරුම් ගැනීමේ ශක්තිය, නිදහස් කැමැත්ත, අමරණීයත්වය
55. මෙහෙසුරු දිවැසිවර
56. සුරදූත නිකායික පැවිදි සොයුරියෝ, ජපමාල නිකායික පැවිදි පියවරු, ජපමාල නිකායික පැවිදි සොයුරියෝ
57. රාජගුරු ප්‍රසාද ධූරය, පූජකවරය, තේවාචාර්ය ධූරය
58. ජොහාන් සුවිශේෂය.
59. මැක්ෂියම් කෝල්බේ පියතුමා
60. යහපත හා අයහපත පිළිබඳව දෙවියන් වහන්සේ විසින් ලියන ලද නීතියක් මනුෂ්‍ය හදවතෙහි ඇත. එය හෘදය සාක්ෂිය යනුවෙන් හඳුන්වමු.
61. සමරිතානුවරයාගේ උපමාව
62. සාමය ඇති කිරීම (සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝය. ඔවුහු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝය.)
63. ප්‍රථම මනුෂ්‍යයාවූ ආදම්ය. (රෝම 5/14)
64. දේව සමානාත්මතාවය, මනුෂ්‍යයා තුළ ඇති ආත්මය හෙවත් ස්ප්‍රීතුව
65. පූජාත්වරය ආශිර්වාදකාර බන්ධනය
66. සමදර්ශක සුවිශේෂකවරු - මාක් / මතෙව් / ලුක්
67. නියමිත වචන සමඟින් හිස මත අත තබා ශුද්ධවූ තෛලයෙන් ආලේප කිරීම
68. දිව්‍ය සත්ප්‍රසාදය 69. මතෙව්, ලුක්
70. ශුද්ධවූ ත්‍රිත්වය 71. ශුද්ධවූ පාවුළු තුමා
72. ජොහාන් සුවිශේෂය
73. ස්නාවක ජොහාන්ගේ පියා වූ සෙකරියස්
74. යෙසාය 75. නාතාන් දිවැසිවරයා ( 2 සාමුවෙල් 7/12-16)

# මල්කඩුවාව පාතිමා දහම් දරුවෝ දෙව්මව් යදිති

මල්කඩුවාව පාතිමා දහම් පාසල් දරු දැරියෝ දෙව්මවුන්ට කැපකර ඇති ඔක්තෝබර් මාසය සහ පාතිමා දෙව්මවුන්ගේ වාර්ෂික මංගල්‍යය නිමිත්තෙන් ජපමාල රැළියක් පැවැත්වූහ. මෙය කුරුණෑගල හිටපු මීසම් සේවක ගරු ටෙරන්ස් කන්නන්ගර පූජ්‍යප්‍රසාදීන් වහන්සේගේ ආරාධනයෙන්, කුරුණෑගල පදවියේ ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු ප්ලැසිඩස් දි සිල්වා පූජ්‍ය ප්‍රසාදීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් දහම් ගුරු මැණිවරුන්ගේ හා පියවරුන්ගේ සංවිධානයෙන් මල්කඩුවාව පාතිමා දෙව් මැදුරේදී පැවැත්විණි.

**ශානක මුහන්දිරම්**

03 පිටුවෙන්....

**9 ශ්‍රේණිය -**
පී. ශෙහානි රන්දිකා - සා. ජෝසප් දහම් පාසල - වෙන්නප්පුව

**10 ශ්‍රේණිය -**
රුවනි හංසනි ප්‍රනාන්දු - සා. ජෝසප් දහම් පාසල - වෙන්නප්පුව

## රචනා

**4 ශ්‍රේණිය -**
හසිනි අමාෂා - සා. ජෝසප් දහම් පාසල - වෙන්නප්පුව

**5 ශ්‍රේණිය -**
නෙත්මි තරුෂා - සා. මාටින් ද පෝරස්දහම් පාසල - ගංගොඩ

**6 ශ්‍රේණිය -**
නිසංසලා සඳුනි - සා. මාටින්ද පෝරස්දහම් පාසල - ගංගොඩ

**7 ශ්‍රේණිය -**
හසිනි නිමේෂා - සා. ජෝසප් දහම් පාසල - වෙන්නප්පුව

**8 ශ්‍රේණිය -**
රොෂෙල් ඉෂේන් - සා. ජෝසප් දහම් පාසල - වෙන්නප්පුව

**9 ශ්‍රේණිය -**
තාරුකා දිල්රංගි - ලූර්දු දේව මාතා දහම් පාසල - කොලින්ජාඩිය

**10 ශ්‍රේණිය -**
සචිනි ඇන්ජලෝ - ලූර්දු දේව මාතා දහම් පාසල - කොලින්ජාඩිය

**11 ශ්‍රේණිය -**
කේ. රනිතා - ලූර්දු දේව මාතා දහම් පාසල - කොලින්ජාඩිය

## බයිබල් දැනුම මිනුම

**6 ශ්‍රේණිය -**
ප්‍රථම ස්ථානය - සා. ජෝශප් දහම් පාසල - වෙන්නප්පුව

**7 ශ්‍රේණිය -**
ප්‍රථම ස්ථානය - සා. ජෝශප් දහම් පාසල - වෙන්නප්පුව

**8 ශ්‍රේණිය -**
ප්‍රථම ස්ථානය - ලූර්දු මාතා දහම් පාසල - කොළින්ජාඩිය

**9 ශ්‍රේණිය -**
ප්‍රථම ස්ථානය - සා. මාටින්ද පෝරස් දහම් පාසල - ගංගොඩ

**10 ශ්‍රේණිය -**
ප්‍රථම ස්ථානය - සා. ජෝශප් දහම් පාසල - වෙන්නප්පුව

**11 ශ්‍රේණිය -**
ප්‍රථම ස්ථානය - සා. මාටින්ද පෝරස් දහම් පාසල - ගංගොඩ

# ජපමාල විරුවෝ

ඔක්තෝබර් මාසය ජපමාලයට කැප කර ඇති නිසා ජපමාලය මහත් ලැදියාවක් - භක්තියක් වගේම නිරතුරුව ජපමාලය උච්චාරණය කරන්නට ඇප කැපවූ ලොව ප්‍රකට කිතුනු විරුවන් අතරින් කීප දෙනෙකුගේ ජීවිත අත්දැකීම් ඔබ හා බෙදා ගැනීමට මං අදහස් කළා.

ජපමාල භක්තිය ලොවට හඳුන්වා දුන්නේ සාන්ත දොමිනික් මුනි තුමාය. 13 වන සියවසේ ප්‍රංශයේ ඇල්බිජෙන්සස් නම් සභාවේද භේදය තදින් පැතිර ගියා. මේ ගැන මහත් කනස්සල්ලට පත්වූ දොමිනික් තුමා වන වැදී, යැදුමෙන් ද මර්දන ක්‍රියා හා නිරාහාර ශීලයෙන්ද මීට විසඳුම් සෙවීමට වෑයම් කළා. එහිදී මරිය වහන්සේ එතුමාට දර්ශනය වී ජපමාලයේ ආධ්‍යාත්මික අවිය සභා වේද භේද කරුවන් ජය ගැනීමේ මඟ බවත්, නොකඩවා ජපමාලය උච්චාරණය කරන අතර ජපමාල බැතිය ලොව පුරා පතළ කරන ලෙසත් ඉල්ලා සිටියා. මින් උද්යෝගයට පත් දොමිනික් තුමා ජපමාලය ව්‍යාප්තියේ පුරෝගාමියෙක් වුණා. තම දෙසුම් වලදී එතුමාව මරිය වහන්සේ මෙ-හෙයවූ අයුරු එතුමාගේ ජීවිත කථාවේ කියැවෙනවා. ලෝකයට ජපමාලය හඳුන්වා දුන්, ජපමාල බැතිය ප්‍රචලිත කළ සාන්ත දොමිනික් තුමා මේ අනුව ජපමාලයේ සැබෑ විරුවෙක්.

සාන්ත දොමිනික් තුමාගෙන් පසුව ජපමාලය ව්‍යාප්ත කරන්නට පුරෝගාමී වුයේ ගරු ඇලන් ඩෙලා රොච් නම් පියතුමායි. ජපමාල බැතිය අමතකව ගිය යුගයක බ්‍රිතාන්‍යයේ ඩිනාන්හි උපන් එතුමාට 1349 දී ඉතාලිය, ජර්මනිය, ප්‍රංශය, පෝලන්තය හා හංගේරියාවේ පැතිර ගිය වසූරිය වසංගතය හමුවේ ජනතාවට සැනසීම ලැබෙන්නේ ජපමාලයෙන් බව දේව අම්මා ප්‍රකාශ කළා. 1376 දී තවත් සභා වේද භේදයක් මගින් යුරෝපයේ බරපතල තත්වයක් මතු වෙද්දී ගරු ඇලන් ඩෙලා රොච් පියතුමා ජපමාල බැතිය යළි පණ ගන්වන්නේ 1460 දී පමණ. මේ නිසාම ජනතාව නැවත වරක් ජපමාලය වටා රොද බැඳ ගත්තේ හරි පුදුමාකාර විදිහටයි.


ශිරාන් මෛත්‍රී

ශුද්ධවූ පියෝ මුනිඳුන් ජිවත්ව සිටි කාලයේ දිනකට ජපමාල 40 - 50 ප්‍රමාණයක් උච්චාරණය කළ බැව් කියවේ.

සසුන් ඉතිහාසය පුරා ශුද්ධෝත්තම පියතුමන් ගණනාවක් ජපමාල බැතිය පෙරටු කරගත් බවට සාක්ෂි තිබෙනවා. 16 වන සියව-සේදී අතිඋතුම් පස්වන පියුස් ශුද්ධෝත්තම පියතුමා සාන්ත සභාව විනාශ කරන්නට පෙළ ගැසුණු තුර්කි හමුදා පරාජය කරන්නට යොදා ගත්තේ ජපමාලයයි. සටනට පෙර පුරා පැය තුනක් නොකඩවා ජපමාලය උච්චාරණය කරන්නැයි උපදෙස් දුන් එතුමා සටන් කාලය පුරා සෙසු ජනතාවට නොකඩවා ජපමාලය උච්චාරණය කරන්නැයි ඉල්ලා සිටියා. තුර්කි හමුදාව ලැපැන්ටෝ හිදී පරාජය කිරීම ගැන එදා මුළු ලොවම විමතියට පත්වුණා. 1571 ඔක්තෝබර් 07 වැනිදා සනිටුහන් කළ මේ ජයග්‍රහණය වෙනුවෙන් මරි මවුන්ට තුති පිදීමට ජපමාලයේ මංගල්‍යය දිනය ලෙස එදා තුති පිදීමට එදා අති උත්තම පස්වන පියුස් සසුන් පියා නම් කළා. පසු කාලයේදී අතිඋතුම් දොලොස් වන පියුස් පියා ඔක්තෝබර් මාසය ජපමාලයේ මාසය ලෙස නම් කළා.

අති උතුම් දසතුන් වැනි ලියෝ සසුන් පියාණන්ද ජපමාල බැතිය කෙරේ මහත් ඇල්මක් දැක්වූ අතර 1883 සැප්තැම්බර් 1 දා නිකුත් කළ රසුප්‍රිමි අපොස්ට්‍රලාටුස් ඔෆීෂියෝ නම් විශ්ව ලේඛනයේ ලෝකයේ දුව පැන ඇවිදිමින් සමාජයට විනකටින යක්ෂයා මෙල්ල කරන්නට ඇති බලගතම අධ්‍යාත්මික ආයුධයය ජපමාලය යැයි හඳුන්වා දී තිබේ.

දෙවන වතිකාන කතිකා සුදානම් මැද වුවද භාග්‍යවන්ත විසිතුන්වන

## කිතුනු උරුමය

ජුවාම් ශුද්ධෝත්තම පියතුමාද ජපමාලයේ අධ්‍යාත්මික සප්‍රිතුව ඉතා බලගතු බැව් වටහා ගෙන තිබිණි. අති උත්තම සවැනි පාවුළු ශුද්ධෝත්තම පියතුමාද ජපමාලයේ ධර්මදානීය ලක්ෂණ සහ ක්‍රිස්තු කේන්ද්‍රීය වටිනාකම් මැනවින් හඳුනාගෙන ජපමාල උච්චාරණයට නිරතුරු දිරි දුන්නේය.

අතිඋත්තම දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා මරිය මාතාවන් කෙරේ තම භක්තිය ප්‍රකාශ කළේ සිය නිල ලාංඡනයට M සළකුණ යොදා ගනිමිනි. කොමියුනිස්ට් පෝලනත්යේ ආගම් පීඩනය මැද දිවි ගෙවූ කැරොල් වොයිටිල්ලා නම් එතුමා කුඩා කල පටන් ජපමාලය උච්චාරණය දෛනික ජීවිතයේ එක් අංගයක් බවට පත් කර ගත්තේය. "යමෙක් මරිය තුමියට සමීප වන්නට කැමතිද ? එසේනම් ජපමාල උච්චාරණයට වඩා වෙනත් මගක් නැතැ"යි අවධාරණය කළ උන්වහන්සේ ජපමාල

උච්චාරණය සඳහා ආලෝකයේ අභිරහස් හඳුන්වා දුන්හ.

1978 ඔක්තෝබර් 22 දින බලාපොරොත්තු රහිත ලෙස සසුන් පියා පදවියට පත්වූ විටද උන්වහන්සේ කාදිනල් මණ්ඩලය තමන් වෙත පවරන ලද මේ හාර දූර නිලය දේව මාතාවන් වෙත තබන දැඩි විශ්වාසය මත හාර ගන්නා බව පැවසූහ. 1981 මැයි 13 වැනිදා තුර්කි වෙඩික්කරුවකුවූ මෙහෙමුද් අලි අග්කාගේ වෙඩි පහරට ගොදුරුවූ අවස්ථාවේ අතිඋතුම් දෙවන ජුවාම් පාවුළු සසුන් පියාණන්ව මරිය මාතාව වත්තන් කරගෙන සිටින අන්දම දැක්වෙන ඡායාරූපය එතුමන් සග සැපත්වූ පසු ප්‍රකාශයට පත්වූ අතර එය මුළු ලොව පුරා මහත් තිගැස්මක් ඇති කිරීමට තුඩු දුන්නේය. එහෙත් උන්වහන්සේ 1984 මාර්තු 25 වැනිදා පෘතුගාලයේ පාතිමා අප ස්වාමිඳු සිද්ධස්ථානයට ගොස් මුළු ලෝකය දේව මාතාවන්ගේ නිර්මල හෘදයට කැප කළහ. අතිඋතුම් දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා එදා ඒ මාරක වෙඩි පහරින් තමන් ගැලවුනේ මරිය තුමියගේ මැදිහත් කමින් බව ප්‍රකාශ කළේ වරක් දෙවරක් නොවේ. මීට අමතරව උන්වහන්සේ 1987 මාර්තු 25 ගැලවුම් කරුවාණන්ගේ මාතාව නමින් විශ්ව ලේඛනයක් නිකුත් කළහ. එය මරිය මාතාවන් ගැන ලියැවුණු උසස්ම නිර්මාණය ලෙස සැලකේ.



අතිඋතුම් දෙවන ජුවාම් පාවුළු සසුන් පියාට වෙඩි වැදුණු මොහොතේ දේව මාතාවන් එතුමාව වත්තම් කරගත් අයුරු කැමරාවක සටහන් ව තිබුණේ මෙසේය.

ශුද්ධවර පියෝ මුනිඳුන්ද ජපමාල භක්තිය කෙරේ යොමුවූ විශේෂ අයෙකි. ශ්‍රී වණ කැළැල් ලාභී එතුමාට ළදරු වියේදී මව ජපමාලයක් තිළිණ කර දුන් අතර එදා සිට සගසුව දිනන තෙක් දිනපතා ජපමාල උච්චාරණය එතුමන්ගේ දිවියේ අනිවාර්ය අංගයක් විය. පසුකලෙක නිරතුරුවම ජපමාලය දැතේ රඳවා ගත් එතුමා දිනකට ජපමාල 40-50 අතර සංඛ්‍යාවක් උච්චාරණය කළේය. සිය මරණ මොහොතේ දී පවා අවට සිටි අය ගෙන් නොකඩවා ජපමාලය උච්චාරණය කරන්නැ යි උන්වහන්-සේ ඉල්ලා සිටියහ.



ජපමාල උච්චාරණය නවමං ගැන්වීමට 16 වන සියවසේදී උරදුන් අතිඋතුම් 5 වන පියුස් ශුද්ධෝත්තම පියතුමා

භාග්‍යවන්ත ජුසේ වාස් පියතුමාද ජපමාල බැතිය කෙරේ මහත් ඇල්මක් හා උනන්දුවක් දැක්වීය. ජපමාලයක් ගෙල පළඳාගෙන ව්‍යාංගාර්ථයෙන් සිය කතෝලික කම හැගවූ ජුසේ වාස් පියතුමා 1677 අගෝස්තු 05 දා ගෝවේ සාන්කෝලේ දෙව්මැදුරේදී සිය දූත කාර්යය සඳහා දිවුරුම් දුන්නේ දේවමාතා ප්‍රතිමාවක් අබියසය. මහනුවර රාජධානියේ එතුමා ඉදි කළ මුල් දෙව් මැදුර කැප කළේ 1699 දේව මාතා උපන් දින මංගල්‍යය දා දේව මාතාවන්ටය. ජනතාවට ජපමාල උච්චාරණය හුරු කළ එතුමා දිව්‍ය පූජා යාගය නොපැවැත්වෙන අවස්ථාවලදී ජපමාලය උච්චාරණය කරන්නට ජනතාව පෙළඹ විය. එසේම දිනපතා රාත්‍රී නින්දට යෑමට පෙර පවුලක් ලෙස එකතුවී දේව මාතාවන් වෙනුවෙන් ජපමාලය යදින්නට පුරුදු පුහුණු කළේ ද එතුමාය.

මේ ආදී වශයෙන් ලොව පුරා විසූ බොහෝ සාන්තුවරුන්, ප්‍රාඥයන් හා විශේෂඥයන් ජපමාල භක්තිය ගැන පළ කළ ජීවිත අත්දැකීම් රැසකි. ඒ සියල්ල මෙහි ඇතුළත් කිරීමට ඉඩකඩ නොමැත. පුංචි දූ පුතුන් වන ඔබටත්, ඔබේ ජීවිතයටත් මෙය කදිම ආදර්ශයක් නේද ?

# ඉංග්‍රීසි පාඩම
# විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

## පාඩම් අංක : 31

| **Simple Past** (සිම්පල් පාස්ට්) | **Past Perfect** බවට පෙරළේ (පාස්ට් පර්ෆෙක්ට්) |
|---|---|

(සමහර අවස්ථාවලදී Past Tense ම යෙදිය හැක.

| | |
|---|---|
| "I ate rice." | She said that she had eaten rice. |
| "I didn't see kanthi." | He said that she hadn't seen kanthi. |
| "I was late." | He said that he had been late. |
| "Kamani wasn't at home." | He said that Kamani had not n been at home. |

## Modals

| **Present Modals** | **Past Modals** බවට පෙරළේ. |
|---|---|
| "I ***will wash*** the dishes." | She said that she ***would wash*** the dishes. |
| "I ***won't*** go." | He said he ***wouldn't*** go. |
| "I ***can*** dance." | He said he ***could*** dance. |
| "Mary ***can't*** swim." | He said that Mary ***couldn't*** swin. |
| "There ***may*** be a problem." | He said that there ***might*** be a problem. |

**Have to/has to** සහ **must** **had to** බවට පෙරළේ.

මේ have to / has to හෝ must යන වචන වලින් කියැවෙන්නේ යමක් කළ යුතුමයි යන අදහසයි. එහි අතීතය ලෙස සැලකෙන්නේ. "had to" යන වචන දෙකයි.

| | |
|---|---|
| " I have to clean my room." | He said that he had to clean his room. |
| " I don't have to write that letter." | He said that he didn't have to write that letter. |
| " Nimali must work today." | He said that Nimali had to work that day. |
| " I don't have to clean the room." | He said that he didn't have to clean the room. |
| " Swarna doesn't have to go to class." | He said that Swarna didn't have to go to class. |
| "I must go to the town." | She said that she had to go to the town. |

<u>සමහර ***Modals*** මාරුවෙන්නෙ නැති බවත් මතක තබාගන්න.</u>

Should, Would, Could, Might, Ought to, යන Modals ඒ මාරුවෙන්නෙ නැති වචනයි. හොඳින් ඒවා මතක තබාගන්න.

| | |
|---|---|
| "I would like a tea." | He said that he would like a tea. |
| "She couldn't go to the party." | She said that she couldn't go to the party. |
| "It might rain today." | He said that it might rain today. |
| "You should be nice to your friends." | Our teacher said that we should he nice to our friends. |

<u>විශ්ව සත්‍යයක් ගැන කීමේදී හෝ අවස්ථා වෙනස් වී නැති අවස්ථාවකදී, **Present Simple, Past Simple** බවට පත් නොකර, වර්තමාන කාලයෙන්ම පමණක් තැබිය හැක.</u>

| | |
|---|---|
| "The sun rises in the East." | He says that the sun rises in the East. |

" I will not come to the party tonight."
Sunil says that he will not come to the party tonight.

ඇතැම් අවස්ථාවලදී "must" යන වචනයද වෙනස් නොකර භාවිතා කළ හැකිය.

නිදා:- He said, " I must go to the doctor today."
He said that he must go to see the doctor today. (අවස්ථාව වෙනස් වී නැත්නම්)

<u>අභ්‍යාසය</u>

පහත සඳහන් **Direct Speech** වැකි **Indirect** බවට පත්කරන්න.

1. Sunil says, "I am going to Anil's place today."
2. Kamala says, "Sriyani is a good girl."

3. Nirmala says, " I walk to office everyday."
4. Kumari said, " I walk to office everyday."
5. Namal said, "Kamala knows how to drive a car."
6. The teacher said, " Anil has not done his home work."
7. My mother said, "The cat has eaten the plate of fish."
8. The doctor told me, " Don't eat beef."
9. My friend told me, "Please come quickly."
10. Kamal asked the sick woman," Why don't you go to hospital?"
11. The Singer asked Harry, "Can you play the guitar when I sing?"
12. Shamalee said, "I can't go to the market today."

<u>පිළිතුරු</u>

1. Sunil says that he is going to Anil's place today.
2. Kamala says that sriyani is a good girl.
3. Nirmala says that she walks to office everyday.
4. Kumari said that she walked to office everyday.

   or

   Kumari said that she walks to office every day.
5. Namal said that Kamala knew how to drive a car.

   or

   Namal said that Kamala knows how to drive a car.

   (අවස්ථාව අනුව)
6. The teacher said that Anil hadn't done his homework.
7. My mother said that the cat had eaten the plate of fish.
8. The doctor advised me not to eat beef.
9. My friend asked me to come quickly.
10. Kamal asked the sick woman why she didn't go to hospital.
11. The singer asked Henry whether he could play the guitar when he the sang.
12. Shamalee said that she couldn't go to the market today.

    **<u>or</u>**

    Shamalee said that she couldn't go to the market that day.

    (අවස්ථාව අනුව)

# <u>"If"</u>

**අපි ඊළඟට ඉංග්‍රීසි භාෂාවේදී අපිට ඉතාමත් වැදගත් වන <u>"If"</u> (ඉෆ්) කියන වචනය ගැන ටිකක් අවධානය යොමු කරමු.**

මොකක්ද මේ "If" කියන වචනෙ තේරුම? "If" කියන්නෙ යමක් සිදුවුනොත් කියන අවිනිශ්චිත බව හඟවන වචනයක්. මේ "If" භාවිතාව පිළිබඳ අවස්ථාවන් 3 ක් ඉංග්‍රීසි භාෂාවේදී දළ වශයෙන් හඳුන්වනවා. අපි ඒ අවස්ථාවන්ට **<u>"Conditionals"</u>** කියලයි කියන්නේ.

Conditional කියන එකේ තේරුම යම් කිසි තත්ත්වයකට පාත්‍ර වූ යම්කිසි තත්ත්වයකට කොටුවූ, මැදිවූ කියන අදහස දෙන වචනයක්. යම්කිසි තත්ත්වයක් උදාවුනොත් පමණක් ඒ තත්ත්වය මත පිහිටා තවත් දෙයක් සිදුවිය හැකියි කියන අදහස කියැවෙන නිසා මෙම "තත්ත්ව ගත කිරීම" හඳුන්වන්නට අපි Conditional කියන වචනය යොදනවා.

<u>මේ අවස්ථාවන් 3 **("Conditionals")** මෙවයි.</u>

*1. සාමාන්‍යයෙන් සිදුවිය හැකි අවස්ථාවන්*
*2. මනංකල්පිත / සාමාන්‍යයෙන් සිදුවේයැයි බලාපොරොත්තු නොවන අවස්ථාවන්*
*3. අතීතයේ සිදුවිය හැකිව තිබූ එහෙත් සිදුනොවූ අවස්ථාවන්*

අපි විස්තර ඇතිව මේ අවස්ථාවන් ගැන බලමු.

මේ වැකි දිහා බලන්න. අපි සිංහලෙන් මෙහෙම දේවල් කියනවා.

- ඔයා <u>ආවොත්</u> මම පොත දෙන්නම්.
- හොඳට <u>ඉගෙන ගත්තොත්</u> විභාගෙ පාස්වෙයි.
- අඹ ඉදිල <u>නැත්නම්</u> කඩන්න එපා.
- ඔයා <u>යනවනම්</u> මාත් එන්නම්.
- මම <u>හිටියනම්</u> ඕක වෙන්නෙ නෑ.

මේ ඉහත වැකි හැම එකෙන්ම කියැවෙන්නේ යම්කිසි අවිනිශ්චිත තත්ත්වයක් ගැනයි. ආවොත්, ඉගෙනගත්තොත්, යනවනම්, හිටියනම්, හිටියොත්, වැස්සොත්, පරක්කුවුනොත්, පුළුවන් වුනොත්... යනාදි වශයෙන් නොයෙකුත් අවස්ථාවල අපි මේ අවිනිශ්චිත බව ගැන කතාකරනවා.

මෙන්න මේ වගේ අදහස් ප්‍රකාශ කිරීමට අපි ඉංග්‍රීසියේදී භාවිතා කරන වචනයක් තමයි "If" කියන්නෙ.

හැබැයි ඒක ඉංග්‍රීසි වැකිවල යෙදීමේදී සිංහල වගේ නෙමේ. කිසියම් රීතියකට අනුව තමයි භාවිතා කළ යුත්තේ

## අපි දැන් පළමුවෙනි අවස්ථාව ගැන (Conditional - 1) වෙත යොමුවෙමු.

- If you come, I will give the book.
  ඔයා ආවොත්, මම පොත දෙන්නම්.
- If it rains, we will not play football.
  වැස්සොත් අපි ෆුට්බෝල් ගහන්නෙ නෑ.
- If Sunil doesn't come, who will give the speech?
  සුනිල් නාවොත් කතාව දෙන්නෙ කවුද?
- If I find your pen, I 'll give you.
  ඔබේ පෑන මට හම්බවුනොත්, මම ඔබට දෙන්නම්.
- If mother goes to the market, she will buy some mangoes.
  අම්මා මාකට් එකට ගියොත් අඹ ටිකක් ගෙනේවි.
- If I like it, I will buy it.
  මම ඒකට කැමති නං, මං ඒක මිලදී ගන්නවා.

බලන්න, ඉහත වැකි වලින් කියැවෙන්නේ <u>සිදුවිය හැකි, සිදුවීමට ඉඩ ඇති</u> යම් දෙයක් පිළිබඳවයි.

## දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ



**නිවොත් අකලංක**
2 ශ්‍රේණිය,
මාරිස්ටෙලා විදුහල, මීගමුව

**පුංචි අපේ චිත්‍ර පිටුව**

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

## ශු. ජුඩ් තද්දේවුස් මුනිතුමා



**රොෂේල් ඇන්ජලෝ පෙරේරා**
7 ශ්‍රේණිය,
ලාසරස් මුනිඳුන්ගේ
දහම් පාසල,
හේකිත්ත

## දේව අම්මා



**ඇන් දිල්මි රවීෂා**
4 ශ්‍රේණිය,
සිරිකුරුස විදුහල,
ගම්පහ

## දිය ඇල්ලක්



**සචිනි නිමාෂා**
6 ශ්‍රේණිය,
සා. අන්තෝනි දහම් පාසල,
නයිනමඩම.

## මල් උයනේ යාච්ඤා කරන ජේසුස් වහන්සේ



**බී. අප්සරා සිරිවර්ධන**
11 ශ්‍රේණිය,
ශු. ඌගෝ මුනිඳු දහම් පාසල,
බුරුල්ලපිටිය

## අපේ පල්ලිය

**නිමුතු බාතිල ප්‍රනාන්දු**
2 ශ්‍රේණිය,
සා. පේදුරු හා පාවුළු
දහම් පාසල
රත්නපුර



## මල් බඳුනක්



**ඩී. එම්. චමෝද් අවිෂ්ක**
3 ශ්‍රේණිය,
සා. අන්තෝනි දහම් පාසල, දුනකදෙණිය.

## ළමා ප්‍රදීපයට මල් මිටක්



**සිත්මල් උදාන සිල්වා**
1 ශ්‍රේණිය,
ලොයොලා විද්‍යාලය - බෝපිටිය

## අපේ ගෙවත්ත



**ඩිමාෂි විශ්මිකා ජයරාම්**
ලිසියෝ පෙර පාසල,
ගම්පහ



## සුදතුම් වරම් ලැබීම



**හලාවත පදවිය**

**(ප්‍රසාද් නුවන්ත විසිනි)**

සිරිගම්පොළ මීසමේ දරු දැරියෝ 92 ක් පසුගියදා අභිවෘද්ධි ආලේපය ප්‍රසාද නිධානය ලබා ගත්හ. ගාල්ල රදගුරු අතිඋතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණෝ මොවුන්ට සුදතුම් වරම් දානය කළහ. මීසම් සේවක ගරු ඇලෙක්ස් වීරසූරිය පියතුමන් රදගුරු හිමිපාණන් සමග සුදතුම් වරම් ලැබූ ළමුන් ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු




**හලාවත පදවිය**



මදුරන්කුලිය මීසමට අයත් සා. රෆායෙල් දේවස්ථානයේ ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූ ළමුන් 13 දෙනෙකු මීසම් සේවක ගරු ෂෙල්ටන් විජේතුංග පියතුමන් හා ගුරු භවතුන් සමග සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු ( **පැතුම් ලක්ෂාන්** )

**අගරදගුරු පදවිය**



මොරටුව සාන්ත සෙබස්තියන් දෙව්මැදුරට අයත් දහම් පාසලේ දැර දැරියෝ 28 දෙනෙක් පසුගියදා පළමුවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. මොරටුව මීසම් පති ගරු බර්ට්‍රම් රංජිත් මීසම් සහයක රංජන් ප්‍රියදර්ශන යන පියතුමන්ලා යටතේ ළමුන් සූදානම් කළ ගරු පැවැදි සොයුරියන් දහම් ගුරු භවතුන් සමග දරු දැරියන් ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

**ඩොරින් පෙරේරා**

## නයිනමඩමේ ළමුන් අතර ළමා ප්‍රදීපය ජනප්‍රියයි ! දෙමසකදී පුවත්පත් අලෙවිය 100 ක් දක්වා වැඩිවීමක්

හලාවත පදවියට අයත් නයිනමඩම මීසමේ දහම් ළමුන් අතර ළමා ප්‍රදීපය ජනප්‍රියව ඇත. මීට මාස දෙකකට ඉහතදී පුවත්පත් 05 කින් අලෙවිය ආරම්භ කෙරෙනි. පුවත්පත් 25 ක් පමණ අලෙවි වෙද්දී නයිනමඩම සා. අන්තෝනි, වික්ෂෝප දේව මාතා හා මුට්ටුව ස්නාපනය ලැබූ ජේසුස් වහන්සේගේ දහම් පාසල් හි ළමුන් සඳහා ළමා ලේඛක වැඩ මුළුවක් පැවැත්වුණි. මෙය මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසිනි. මෙම වැඩ මුළුවෙන් පසු නයිනමඩම මීසම් දරු දැරියෝ මහත් ආශාවෙන් හා උනන්දුවෙන් යුතුව ලේඛන කටයුතු වල නිරත වෙති. නිර්මාණයන් කිහිපයක් ළමා ප්‍රදීපයෙහි පළ වුනි. මේ වනවිටදී ළමා ප්‍රදීපය පුවත් පත් 100 ක් නයිනමඩම මීසමේ අලෙවි කෙරේ. දෙමසක් ඇතුළතදී ළමුන් අතරට ළමා ප්‍රදීපය ගෙන යෑමට මීසම් සේවක ගරු පයස් නිහාල් පියතුමන්ගේ අධීක්ෂණය යටතේ මීසම් සහයක ගරු දිලංකා නිර්මාන් පියතුමාගේ විශේෂ උනන්දු වන හා කැපවීමත් දහම් ගුරු භවතුන්ගේ සහයත් විශේෂයෙන් කැපී පෙනෙන්නකි. **ලාලනි ප්‍රනාන්දු, දහම් පාසල් නියෝජිත**

# ජය පිට ජය ලබමින් වාර්තා තබනා මලල ක්‍රීඩකයෙක්




**මොරිස් බොල්ලෑගල විසිනි**

නොබෝදා හෝමාගම දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයේදී පවත්වන ලද සමස්ත ලංකා පාසල් මලල ක්‍රීඩා උළෙලේදී වයස අවුරුදු 15 පහළ උස පැනීමේ ඉසව්වෙන් ප්‍රථම ස්ථානය දිනා ගැනීමට උදයන්ත බණ්ඩාර සිසුවා සමත් විය. මොහු හුණුපිටිය දෙව් මැදුරේ පූජ උදව් සමිතයේද සාමාජිකයෙකි.



උදයන්ත බණ්ඩාර

මොහු වත්තල සා. ආනා දහම් පාසලේ ඉගෙනුම ලබයි. උදයන්ත රාජගිරිය ගේට්වේ ජාත්‍යාන්තර විදුහලේ ඉගෙනුම ලබයි. පාසල නියෝජනය කරමින් තරඟ වැදුන උදන්ත 2011 වසරේ පවත්වන ලද කොට්ඨාශ, කලාප සහ බස්නාහිර පළාත් යන මලල ක්‍රීඩා හැමකමකදීම උස පැනීමේ ඉසව්වෙන් ප්‍රථමයා වීම විශේෂත්වයකි.

මීට පෙරදී මහනුවර බෝගම්බර ක්‍රීඩාංගනයේදී පැවති සර් ජෝන් ටාබට් කනිෂ්ඨ ශූරතාවලියේදි 15 පහළ උස පැනීම සඳහා මීටර් 1.82 උස පැණිම තුළින් නව වාර්තාවක් පිහිටුවීමට මෙම ලාබාල ක්‍රිඩකයාට හැකි විය.

උදයන්ත බණ්ඩාර හුණුපිටිය දිව්‍ය ගැලවුම්කාරයාණන්ගේ දේවස්ථානයේ මරිය හමුදා උප සභාපති කේ. ඇම් පද්මා අබේරත්න සහ ඩී.යු. බණ්ඩාර නවරත්න යන අයගේ දෙටු පුත්‍රයාද වෙයි. තම ගමනට දිරි දුන් තම දෙමාපියන්, මලල ක්‍රීඩා පුහුණුකාරිනි දීලිමා පිටර්සන් මහත්මිය ඇතුලු සියලු සැම දෙනාවම මොහු කෘතවේදිව සිහිපත් කරයි.

# ළමා ප්‍රදීපය වැඩි වැඩියෙන්ම කියවන්න

කතෝලික දරුවන් වන අපි ළමා ප්‍රදීපය කියවිය යුතුයි. ළමා ප්‍රදීපයෙන් ළමා අපට ලැබෙන දැනුම මිල කරන්නට නොහැකිය. මෙම පුවත්පතේ 3 වන උපන් දින සැමරුම වෙනුවෙන් නිකුත් කළ ළමා ප්‍රදීපය පුවත්පතේ පළවූ. "ළමා ප්‍රදීපයේ ඉදිරි ගමන පුංචි ඔබයි" මැයෙන් ළමා ප්‍රදීපයේ සහය සංස්කාරක කුමර නයනජිත් මහතාගේ එම ලිපිය ඉතාමත් අගය කරමු. බොහෝ පිරිස් මේ සඳහා යහපත් ප්‍රතිචාර දැක්වූවත් ඇතැම් සමහරුන් මෙයට ඉතා අඩු සැලකිල්ලක් දක්වන බැව් ඔහු සඳහන් කරයි. මෙම ලිපියේ කුමර මහතා බොහෝ දුරට දහම් පාසල්, කතෝලික පාසල් වල ළමා ප්‍රදීපය පුවත්පත අලෙවි වුවත් ඇතැම් ජනප්‍රිය හා සුපිරි කතෝලික පාසල් වල ළමා ප්‍රදීපය අලෙවි නොකිරීම ගැන සඳහන් කර ඇත. මෙය නම් කණගාටුවට කරුණකි. කොළඹ කතෝලික මුද්‍රණාලය මගින් කෙරෙනා මෙම අගනා මෙහෙවරත්, රු. 10 ක වැනි සහන මිලකට අලෙවි කිරීමත් අපි අගය කළ යුතු නොවේ ද ? සතිපතා මෙය මිලදී ගෙන කියවීමට මම අමතක නොකරමි. ළමා ප්‍රදීපය එනතුරු මම නොඉවසිල්ලෙන් බලා සිටිමි. විටින් විටද ළමා ප්‍රදීපයෙන් මගේ නිර්මාණ පළවී ඇත.

ආදර නංගියේ, මල්ලියේ මෙම පුවත් පත වැඩි වැඩියෙන් මිලදි ගෙන නිර්මාණ යොමු කරන විටයි මෙම අනගි මෙහෙවර සාර්ථක වන්නේ. එබැවින් ආදර නංගියේ, මල්ලියේ, සොයුර, සොයුරියනි ළමා ප්‍රදීපය කියවීමට උනන්දු වන්න. මේ අපේම පුවත්පතයි. මේ ගැන නොදන්නා අයට ද මෙය මිල දී ගැනීමට යොමු කරන්න. වැඩිහිටියන් වශයෙන් අම්මේ, තාත්තේ ඔබගේ යුතුකමකි, තම දරුවාට යහපත් දේ හොඳම දේ ලබා දීම. ඉතින් මෙවැනි අපේම ආගමේ පුවත්පත් ඔබේ දරුවාට අරන් දෙන්න. ළමා ප්‍රදීපය කියවන සැමගේම යුතුකම කී මේ පිළිබඳව නොදන්නා අය දැනුවත් කිරීම ගරු විදුහල්පති තුමනී, ගුරු මෑණිවරුනි ඔබගේ පාසලේ, දහම් පාසලේ ළමා ප්‍රදීපය මිල දී ගැනීමට යොමු කරන්න. ඔවුන්ට එම අවස්ථාව ලබා දෙන්න. මෙය අලෙවි කිරීම තුළින් ළමා ප්‍රදීපයේ සාර්ථකත්වයට උදව් ලබා දෙන්න. හොඳම දේ දරුවන්ට ලබා දීම වැඩිහිටියන්ගේද යුතුකමකි.

**බී.ඒ. මනෝජ් දිවංක,**
**10 ශ්‍රේණිය, සා. අන්තෝනි දහම් පාසල, බණ්ඩාරවෙල**

## තිබ්බටුගොඩ දහම් ළමුන්ට ලේඛක වැඩමුළුවක් !

ළමුන්ගේ ලේඛන කුසලතාවයන් වර්ධනය කිරීම ඔවුන් ලේඛන කලාවට යොමු කිරීම හා ළමා ප්‍රදීපය පුවත් පත ළමුන් අතර ජනප්‍රිය කරලීමේ මූලික අරමුණින් යුතුව සංවිධානය කෙරෙන ලේඛක වැඩමුළුවක් 2011 නොවැම්බර් මස 06 වන දිනදී තිබ්බටුගොඩ සා. ඉසිදෝර් දෙව් මැදුරේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත. 8 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ළමුන් වෙනුවෙන් පැවැත්වෙන මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසිනි. තිබ්බටුගොඩ මීසම් සේවක ගරු රංජිත් ටෙරී පියතුමන්ගේ අනුශාසකත්වයෙන් දහම් ගුරු මඩුල්ලේ සහයෝගයෙන් මෙය සංවිධානය කෙරේ. **(සොනාලි අනුෂ්කා)**

## ප්‍රහේළිකා අංක 26

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 ගී | තා | 2 ව | ලි | 3 ය | ■ |
| ති | ■ | න් | ■ | 4 හ | ත |
| 5 කා | 6 ව | ද | ■ | ප | ■ |
| ■ | 7 ද | නා | ■ | ත් | ■ |
| ■ | වි | ■ | ■ | ■ | 8 හි |
| 9 ය | ඥ | ම් | ■ | 10 ක | ස |

**ප්‍රහේළිකා අංක 26 ජයග්‍රාහකයන්ට අපේ සුබ පැතුම් !**

**පළමුවන ස්ථානය -** එච්.ඒ නයනි හංසලා
08 ශ්‍රේණිය,
දිව්‍ය හෘදය දහම් පාසල,
ඇල්පිටිය

**දෙවන ස්ථානය -** ඩබ්ලිව්. මාරි චින්තයා
9 ශ්‍රේණිය,
උත්ථානවූ කිතු සමිඳුන්ගේ දහම් පාසල,
දංකොටුව

**තෙවන ස්ථානය -** ඇන් ශානියා
5 ශ්‍රේණිය
සියළු සාන්තුවරයින්ගේ
බාලිකා මහා විද්‍යාලය, කොළඹ 08.

## මොරටු දිසා ධර්මදූත ක්‍රිකට් තරගාවලිය...

මොරටුව දිසා ධර්මදූත ළමා සමාජයේ දරුවන්ගේ සුහදත්වය වර්ධනය කිරීම මුල්කරගෙන පවත්වනු ලැබූ ක්‍රිකට් තරගාවලිය පසුගියදා එගොඩ උයන සුනන්දඋපනන්ද විදුහල ක්‍රීඩාංගනයේ දී පැවැත්වුණි. මෙහි ශූරතාවය විල්ලෝරාවත්ත ඒකකය දිනා ගත් අතර අනුශූරතාවය හිමිවූනේ ඉඳිබැද්ද ඒකකයටයි. මෙම අවස්ථාවට මොරටු දිසා ධර්මදූත අධ්‍යක්‍ෂ ගරු මලින්ත පෙරේරා පියතුමා ඇතුළු දිසාවේ සජීවක සජීවිකාවන්ද සහභාගි විය.

**අසික ප්‍රියදර්ශන**

## ප්‍රහේළිකා අංක 27

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | | | 2 | ■ | 3 |
| | ■ | ■ | 4 | | |
| 5 | | 6 | | ■ | |
| ■ | ■ | | ■ | 7 | |
| 8 | | | | | ■ |
| ■ | ■ | | ■ | | ■ |

**හරහට**

1. සැම දේටම වඩා වැදගත් වන්නේ ප්‍රේමය බව ශු. පාවුළුතුමා මොවුන්ට යවන ලද පළමු ලිපියෙහි සඳහන් වේ.
4. ශු. ලියවිල්ලේ සළමොන්ගේ ප්‍රඥාව පොතේ පවසන්නේ, ප්‍රඥාව මෙයට වඩා අගනා බවයි.
5. ක්‍රිස්තුන් වහන්සේ මෙය මතදී අප වෙනුවෙන් දිවිපිදූ සේක.
7. ............ ක් නැති ඉඩම කොල්ලකනු ලබන්නේයැයි උපදේශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.
8. ස්නාවක ජුවාම් තුමාගේ පියා

**පහළට**

1. ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයට පසුව ප්‍රදර්ශන දොරටුව අසල සිටි මෙවැන්නෙකු පේදුරු තුමා සුව කළේය.
2. ක්‍රිස්තුන් වහන්සේ උකුත් වන විට දේව මාළිගාවේ මෙය දෙකඩව ඉරීගිය බව ශු. ලියවිල්ලේ සඳහන් වෙයි.
3. රන්කාසි දසය පිළිබඳ උපමාවේ, ස්වාමියා රාජ පදවියක් ලබන පිණිස මෙහි ගිය බව පැවසේ.
6. තම අසල්වැසියා හඳුන්වාදීම සඳහා ක්‍රිස්තුන් වහන්සේ මෙම ජාතිකයාගේ උපමාව වදාළ සේක.
8. එළියා දිවැසිවරයා එම රටේ වූ තුන් අවුරුදු නියගය නිම කරමින්, දෙවියන් වහන්සේ සැබෑවූ එකම දෙවියන් වහන්සේ බව මිනිසුන්ට පෙන්වමින් මෙය ලබා දුන්නේය.

(මෙම ප්‍රහේළිකාව පිරවීමේදි පහත සඳහන් පරිච්ඡේදය ආධාර කරගත හැකිය. ශු. ලූක් 10,19, 23 පරිච්ඡේද, ක්‍රියා 3, ශු. මතෙව් 5, 1 රාජාවලිය 17, සලමොන්ගේ ප්‍රඥාව 7, උපදේශකයා හෙවත් සිරාක් 36, 1 කොරින්ති 13)

**නිවැරදිව ප්‍රහේළිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්,**
**ප්‍රහේළිකා අංක 26, ළමා ප්‍රදීපය,**
**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,**
**කොළඹ 08 යන ලිපිනයට එවන්න.**

**( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )**

**ප්‍රහේළිකා අංක 26 පිළිතුරු හා ප්‍රහේළිකා අංක 27 ලබන සතියේ පළ වේ.**

# ගැලවුම්කාර ජේසු

46 කොටස

ශු. ජුවාම්තුමාගේ සුවිශේෂයෙන්

සැකසුම : තිළිණ අලහකෝන්





කොළඹ 08, ඥානාර්ථ ප්‍රදීපය මාවත, අංක 2 හී, ගරු සී.ඩී. සී. රොහාන් ද අල්විස් පියතුමන් විසින් එහිම කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කොට ප්‍රසිද්ධ කරන ලදී.
සංස්කාරක ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා